# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2369/31 - 2024 පෙබරවාරි මස 01 වැනි බ්‍රහස්පතින්දා - 2024.02.01**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී.-බී. 1/2012 (VI)

**1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත**

1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61 වන වගන්තියේ (I) උපවගන්තියේ (ඍඅ) සහ (ඍආ) ඡේද යටතේ ධීවර අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

ඩග්ලස් දේවානන්දා,
ධීවර අමාත්‍ය.

2024 ජනවාරි මස 29 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

2019 ජුනි මස 3 වැනි දින අංක 2126/6 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2019 නියමුවන් (දේශීය ධීවර බෝට්ටුවල) සඳහා ප්‍රවීණතා සහතික නිකුත් කිරීමේ නියෝග, එහි 10 වන නියෝගයට ඉක්බිතිව ම, පහත දැක්වෙන නියෝග ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"10අ. යම් තැනැත්තකු විසින් 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ විධිවිධාන සහ ඒ යටතේ සාදන ලද නියෝග උල්ලංඝනය කරමින් ධීවර මෙහෙයුම්වල නිරත වී ඇති බවට සොයාගනු ලැබුවහොත්, එකී තැනැත්තා වෙත 10 වන නියෝගය යටතේ නිකුත් කරන ලද නියමු බලපත්‍රය, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් කාලසීමාවක් සඳහා අත්හිටුවීම හෝ අවලංගු කිරීම සිදු කරනු ලැබිය හැකි ය.

10ආ. 10අ නියෝගය යටතේ ස්වකීය බලපත්‍රය අත්හිටුවනු ලැබ ඇති හෝ අවලංගු කරනු ලැබ ඇති යම් නියමුවකු විසින්, 10අ නියෝගය යටතේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් කාලසීමාවක් සඳහා, මේ නියෝගවල 2 වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති යම් දේශීය ධීවර බෝට්ටුවක නියමුවකු වශයෙන් හෝ කාර්යමණ්ඩල සාමාජිකයකු වශයෙන් සේවය කරනු නොලැබිය යුතුය.".

EOG 02 - 0009


1A - PG 6635 — 1756 (2024/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*